Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල්

චිත්‍ර කලාව

වාරය - පළමු

ශ්‍රේණිය - 13

සැකසුම - R.I.T.N. රත්නායක
ර/ඇඹපොල ශ්‍රී මහින්ද ම.වි

## කාර්ය පත්‍රිකාව - 2 වන සතිය

- **නිපුණතාව 1.0** - **පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි**
- **නිපුණතා මට්ටම 1.2** - **ස්වභාවික රූපී සංරචන ක්‍රම භාවිතයෙන් ස්වභාවික සහ නිර්මිත පරිසරය සංරචනය කරයි.**
- **ක්‍රියාකාරකම** - **1.2.1 "ආගමික උත්සව අවස්ථාවක්" තේමාවට අනුව චිත්‍රයක් නිර්මාණය කරමු**
  **1.2.2 "ගම්බද පරිසරය" ආශ්‍රිත තේමාවක් චිත්‍රණය කරමු.**

## I කොටස

**අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්න වල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) ප්‍රකාශන චිත්‍රයක් හඳුන්වාදීමේ දී වඩාත් ගැළපෙන කියමන වන්නේ

(i) කල්පිතයක් හෝ සැබෑ සිදුවීමක් හෝ පදනම් කරගත් ප්‍රකාශනයකි.
(ii) අත්දැකීමක් ප්‍රකාශ කෙරෙන වර්ණවත් සංරචනයකි.
(iii) කිසියම් තේමාවක් වින්දනාත්මකව රසවත්ව දෘෂ්‍ය මාධ්‍යයෙන් ප්‍රකාශ කිරීමයි
(iv) ඇස පිනවීම වෙනුවෙන් නිර්මාණය වූ වර්ණ සහිත හෝ රහිත සංරචනයකි.
(v) කල්පිතයක් හෝ සැබෑ සිදුවීමක් හෝ පදනම් කරගත් ප්‍රකාශනයකි.

(02) දෘෂ්‍ය කලාවේ යථාර්ථ (Realism) යනු

(i) සොබාදහමේ පවත්නා ජීවී අජීවී වස්තූන්ගේ ස්වභාවය එලෙසින්ම නිරූපණය කිරීමයි
(ii) පර්යාවලෝක මූලධර්ම නිවැරදිව භාවිත කිරීමයි
(iii) සෞන්දර්යය රීතියෙන්ට අනුකූලව සියල්ල නිරූපණය කිරීමයි
(iv) ශාස්ත්‍රාලීය මූලික රීතීන් අනුගමනය කිරීමයි
(v) ප්‍රශස්ත සෞන්දර්ය රීති මත මානව රුව නිරූපණය කිරීමයි

(03) ශාස්ත්‍රාලීය සිද්ධාන්ත අනුගමනය කරමින් යථාර්තවාදීව සිත්තම් කළ ශිල්පියෙකි

(i) එච්. ඒ. කරුණාරත්න
(ii) ජෝර්ජ් කීට්
(iii) ස්ටැන්ලි අබේසිංහ
(iv) සෝමබන්දු විද්‍යාපති
(v) ඒ. සී. ජී. එස්. අමරසේකර

(04) පිවිතුරු දියසායම් මාධ්‍යයක සුවිශේෂී ලක්ෂණයක් වනුයේ

(i) සංගත වර්ණ මතු වී පෙනෙන සේ යෙදීමයි

(ii) සුදු වර්ණය සම්මිශ්‍රණව යෙදීමයි

(iii) විනිවිද පෙනෙන අයුරින් වර්ණ භාවිත කිරීමයි

(iv) දීප්තිමත් වර්ණ කැපී පෙනෙන අයුරින් යෙදීමයි

(v) වර්ණ පදාස වශයෙන් යෙදීමයි

(05) ප්‍රකාශන චිත්‍රයක අඩංගු නොවිය යුතු ලක්ෂණයකි

(i) ක්‍රියාකාරී මානව හා සත්ත්ව ඉරියව්

(ii) සිද්ධියට අදාළ වර්ණ, රේඛා, හැඩතල ගොනු කිරීම

(iii) ඒ සඳහා අවකාශ භාවිතය

(iv) පරිසර ස්වභාවය අධ්‍යයනය නොකිරීම

(v) හැඟීම් ප්‍රකාශනය

**අංක 06 සිට 10 දක්වා අසා ඇති ප්‍රශ්න ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(06) චිත්‍ර ඇඳීමේදී තලය භාවිතය ඉතා වැදගත් වන අතර චිත්‍රමය අවකාශය තුළ තලය .................................
............................................. ............................................................................. ..........................................................................ආදී වශයෙන් ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

(07) චිත්‍රයක් වර්ණ ගැන්වීමේදී සමීප රූප තද පැහැයෙන් ද දුර රූප ලා පැහැයෙන් ද දැක්වීම ................. ............................................................................................................ ලෙස හඳුන්වනු ලැබේ.

(08) හැඩයක නැතහොත් රූපයක ඇති වටකුරු බව හෙවත් රවුම් බව දැක්වීම ............................................ ..................................................................... බව දැක්වීම ලෙස හැඳින්වේ.

(09) සමබරතාව යනු චිත්‍ර මූලිකාංග වන රේඛා, හැඩතල හා ............................................................................ ........................... සමතුලිත කිරීමයි.

(10) චිත්‍ර සංරචනයේදී ප්‍රීතිමත් අවස්ථාවක් නිරූපණය කිරීමට ................................................................................ ..................... වර්ණ යොදා ගනී .

<u>ඇගයීම හා රසාස්වාදය</u>

පහත සඳහන් මාතෘකා ස්වාභාවික හා නිර්මිත පරිසරය ඇසුරෙන් ගොඩ නඟන්න .

(11) ආගමික උත්සව අවස්ථාවක් තේමාවට අනුව චිත්‍රයක් නිර්මාණය කරන්න.

(12) ගම්බද පරිසරය ආශ්‍රිත තේමාවක් චිත්‍රණය කරන්න.

(13) ස්වභාවිකවාදී හැඩතල සහිත විවිධ මානව ඉරියව් හා පරිසරය පිළිබඳ අධ්‍යයනය කරමින් දළ සටහන් අඳින්න.